

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සැබවින්ම ස්වර්ගයෙන් බැසආසේක්ද?

-ඇලන් හේවර්ඩ් -

(Did Jesus really come down from heaven?)

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සැබවින්ම ස්වර්ගයෙන් බැස ආසේක්ද?

## - ඇලන් හේවර්ඩ් -

අප ආරම්භ කිරීමට ප්‍රථම එක් දෙයක් නිසැකවම පැහැදිළි කිරීම අවශ්‍යය.

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සෙගේ පුත්‍රයාණෝය. දෙවින්වහන්සේම හැරුණු විට, විශ්වයේම සිටිනා ශ්‍රේෂ්ඨතම ජීවියා උන්වහන්සේය. මෙම පොත්පිංචෙහි අරමුණ, උන්වහන්සේට ගෞරවකලයුතු ආකාරයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හට ගෞරව කිරීමයි.

අභාග්‍යකට, ස්වාමිවූ යේසුස්වහන්සේ පිළිබඳ බයිබලයේ ඉගැන්වුම නිතරම වරදවා වටහාගෙන ඇත. යේසුස්වහන්සේහට ගෞරව කිරීමේ අවංක නමුත් නොමගයවන සුළු උත්සාහයෙන්, බොහෝ සභා බයිබලීය නොවන දේ උන්වහන්සේ පිළිබඳව උගන්වයි. මෙම පොත්පිංච, එම දෝෂසහිත ආකල්ප නිවැරදි කිරීම සඳහාය.

මෙය කිසිවෙකුගේ ආගමක් විවේචනය කිරීමේ අදහසින් නොවන නමුත්, දෙවියන්වහන්සේගේ පුත්‍රයාවූ යේසුස්වහන්සේ පිළිබඳව බයිබලය උගන්වන්නේ කුමක්දැයි සරලව පෙන්වීමය. මෙය වටහාගත් විට පමණක්, උන්වහන්සේ සඳහා සුදුසු මහිමය ස්වාමීන් සඳහා අපට දියහැක.

### "මම ස්වර්ගයෙන් බැස ආවෙමි"

මෙම පොත්පිංචෙහි මාතෘකාව ප්‍රශ්නයකි: යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයෙන් පැමිණිසේක්ද? එම ප්‍රශ්නයට පිළිතුරු දෙන්නාසේ පෙනෙන පදයක්, යොහන්ගේ සුභාරංචියේ 6 වැනි පරිච්ඡේදයේ ඇත. යේසුස්වහන්සේ මෙසේ පැවසුසේක:

> "මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව, මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය" (38 පදය).

නමුත් අපි නිගමණයකට පැමිණිය යුතු නොවෙමු. මෙම විෂයය පෙනෙන ලෙස සරල නැත. බොහෝ වෙනස් භාෂා ස්වාභාවයන් දෙකක් ඇති නිසා දුශ්කරතාවයක් පැනනගී. එනම් ප්‍රායෝගික භාෂාව සහ රූපික භාෂාවයි. අප සලකාබලන පරිච්ඡේදයේදි එම වර්ග යේසුස්වහන්සේ විසින් යොදාගනු ලබයි.

64 වැනි පදයේදි උන්වහන්සේ මෙසේ පැවසුසේක, "විශ්වාස නොකරන සමහරෙක් නුඹලා අතරෙහි සිටිති". මෙය ප්‍රායෝගික භාෂාවයි. එය පවසන දෙය එය නිශ්චිතව හගවයි. එහි අරුත දරුවෙකුට වුවත් නොවරදී.

නමුත් බොහෝ අනෙකුත් පද එසේ නොවේ. උදාහරණයක් ලෙස 53 සහ 54 පද ගන්න. මෙතැන යේසුස්වහන්සේ මෙසේ පවසනසේක:

> "සැබවක් සැබවක් නුඹලාට කියමි. නුඹලා මනුෂ්‍යපුත්‍රයාගේ මාංස නොකනවා නම්, ඔහුගේ ලේ නොබොනවා නම්, නුඹලා තුළම ජීවනය නැත. මාගේ මාංසය කන්නාවූ මාගේ ලේ බොන්නාවූ අයට සදාකාල ජීවනය ඇත."

මෙය රූපික භාෂාවයි. එය පෙනෙන ලෙස පවසන දෙය නොහගවයි. එය වඩා ගැඹුරු අර්ථයක් උසුලයි. එහි සැබෑ අරුත ගවේශනය කිරීම සඳහා ඔබ අවධානයෙන් සිතිය යුතුය. ප්‍රතිපලයක් ලෙස, අප ප්‍රවේසම් නොවුනහොත්, එය ලෙහෙසියෙන් වැරදිවැටහීමක් ගෙනදේ

ඇත්තවශයෙන්ම, අවිශ්වාස යුදෙව්වෝ යේසුස්වහන්සේගේ මෙම සහ මෙවැනි කියමන් දුරාවබෝධය කරගත්හ. "කන පිණිස තමාගේ මාංසය අපට දෙන්ට මොහුට පුළුවන් කොහොමදැයි" ඔවුන් කීය. සමහර විට, යේසුස්වහන්සේ ස්වජාතිභක්ෂය දේශණාකරනවාදැයි ඔවුන් සිතන්නට ඇත! ඔවුන් කුමක් සිතුවද, ඔවුන් දෝෂසහිත විය.

එසේ නම්, "මම ස්වර්ගයෙන් බැස ආවෙමි" යන ප්‍රකාශය ගැන කුමක්ද? මෙය ප්‍රායෝගිකද? රූපිකද?

ඔය රූපිකවූ බැව් සිතීමට බොහෝ සාක්‍ෂි ඇත. එම පරිච්ජේදයේම 31 වැනි පදයේ, පැරණි ගිවිසුමේ "මන්නා" යැයි හැඳින්වූ දේ පිළිබඳ සඳහනක් ඇත. ඔවුන් කාන්තාරයේ සිටිනා විට තම ජනතාවට කෑම සඳහා, ප්‍රාතිහාර්යයක් මගින් දෙවියන්වහන්සේ සැපයූ එය පූප වර්ගයක් විය. 31 පදයේ වචන මෙසේය, "ඔවුන්ට කන පිණිස (දෙවියන්වහන්සේ) ස්වර්ගයෙන් කෑම දුන්නේය."

මෙය ප්‍රත්‍යක්‍ෂවම රූපක භාෂාවයි. මෙම ප්‍රාතිහාර්යයාත්මක පූප ස්වර්ගයෙහි පුලුස්සා පෘතුවියට ගෙනැවිත් දුන්නේ නැත. එය ස්වර්ගයෙන් පැමිණි බැව් කී ප්‍රකාශය අපට දන්වන්නේ, ස්වර්ගයේ දෙවියන්වහන්සේ එය පෘතුවිය මතුපිට මැවූබවයි.

අස්වැන්න එකතු කරනා කාලයේදී මිනිසුන් ගායනාකරන ජනප්‍රිය ගීතිකාවක් ඇත. එය මෙසේ ආරම්භ වෙයි, "අප අවට ඇති සියලු යහපත් දීමනා ඉහල <u>ස්වර්ගයෙන් එවා ඇත</u>" මෙම වදන් නව ගිවිසුමේ යාකොබ් 1-17න් සෘජුවම ගෙන ඇති අතර. සෑම යහපත් දීමනාවක්ම "පියාණන්වහන්සේ කෙරෙන් ඉහළින් <u>බැස එන්නේය</u>" යනුවෙන් පවසයි. ගොවියෝ එම ගීතිකාව ගයන කල්හි, වචනයේ පරිසමාප්තයෙන්ම "ඉහල ස්වර්ගයෙන්" තම භෝග පැමිණෙන බැව් ඔවුහු නොසිතති. ඔවුහු සරලව අදහස් කරනුයේ දෙවියන්වහන්සේ අප සඳහා අපගේ අස්වැන්න දෙන බවයි.

## <u>රූපික භාෂාව තවදුරටත්</u>

භාණ්ඩවලට මෙන්ම, මිනිසුන් පිළිබඳවද මෙවන් රූපික භාෂාව බයිබලය පාවිච්චි කරයි. "<u>දෙවියන්වහන්සේ විසින්</u> එවන ලද යොහන් නම් මනුෂ්‍යයෙක් ආවේය" යැයි එය අපට පවසයි (යොහන් 1:6). නමුත් යොහන් කෙදිනකවත් ස්වර්ගයෙහි නොසිටියේය. "දෙවියන්වහන්සේ විසින් එවනලදැයි" සරලව අදහස් කලේ, ඔහු සඳහා විශේෂිත කාර්යයක් දෙවියන්වහන්සේ දුන් බවයි.

නමුත් මෙම පැහැදිලිකර දීම් ආදේශකල හැක්කේ යේසුස්වහන්සේ සැබවින්ම "ස්වර්ගයේ සිට පහතට පැමිණි" ලෙස ප්‍රකාශකරන පද සඳහා පමණි. උන්වහන්සේ පෘතුවිය මත දෘශ්‍යමානවීමට බොහෝ පෙර යේසුස්වහන්සේ ස්වර්ගයෙහි ජීවත්වූ බැව් යෝජනාකරන බොහෝ

අනෙකුත් පද ඇත. මේ එයින් එකකි:

"පියාණෙනි (යේසුස්වහන්සේ පවසයි), ලෝකය තිබෙන්නට පළමුවෙන් ඔබ වෙත මට තිබුනු මහිමයෙන් ඔබ වෙත මා ගෞරවයට පැමිණෙවුව මැනව" (යොහන් 17:5).

එවන් පද සඳහා අප කුමක් කල යුතුද? ඒවා ප්‍රායෝගිකද, නැතිනම් රූපිකද? ලෝකය සැදීමට ප්‍රථම යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ සමග සැබවින්ම ස්වර්ගයෙහි ජීවත්වූසේක්ද? එසේ නැතිනම්, මෙයට වඩා ගැඹුරු අර්ථයක් මෙම වචන දරා සිටීද?

මෙම පොත්පිංචෙහි අරමුණ, බයිබලයට තමන් සඳහාම ප්‍රකාශකරන්නට ඉඩහැර, අප සඳහා එම ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීමයි.

## යේසුස්වහන්සේ පිළිබඳ දෘෂ්ඨී තුනක්

බයිබලය නොපිළිගන්නා අය, යේසුස්වහන්සේ තවත් සාමාන්‍ය මිනිසෙකු බැව් පවසති. ඔවුන් වැරදිය. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා වූසේක. ඔවුන්ගේ දෘෂ්ඨීකෝණය සැලකිල්ලට ගනිමින් අප අපගේ කාලය නාස්ති කිරීම අවශ්‍ය නොවේ. නමුත් යේසුස්වහන්සේ පිළිබඳව, බයිබලය විශ්වාසකරන ක්‍රිස්තියානින් විසින් පිළිගන්නා විවිධ දෘෂ්ඨී තුන අප සැලකිල්ලට ගත යුතුය.
[(1) ත්‍රිත්වය (2) ඒරියානු (3) සොසිනියානු ලෙස මේවා දෘෂ්ඨී ශාස්ත්‍රඥයෝ හඳුන්වති. යේසුස්වහන්සේ පෘතුවිය මත දර්ශනය වීමට පෙර ස්වර්ගයෙහි සිටි අදහස උන්වහන්සෙගේ "පූර්වපැවැත්ම" ලෙස හඳුන්වයි. නමුත් මෙම නාමයන් පිළිබඳව අප සැලකිලිමත් විය යුතු නැත)]

බොහොමත්ම පුලුල් ලෙස පිළිගනු ලබන දෘෂ්ඨීය නම් පළමුවැන්නය. එනම්, යේසුස්වහන්සේ යනු මිනිස් ස්වභාවයෙන් සිටිනා සර්වබලධාරී දෙවියන්වහන්සේය යන්නයි. මෙය පිළිගත් අය නිතරම, යේසුස්වහන්සේ "ත්‍රිත්වයේ දෙවැනි තැනැන්වහන්සේ" ලෙස හඳුන්වන නමුත්, මෙම ප්‍රකාශයෙන් ඔවුන් නිශ්චිතවම හඟවන්නේ

තුමක්දැයි සොයාබැලීම පහසු නැත. මෙම දෘෂ්ඨියට අනුව, පෘතුවිය මත දර්ශනය වීමට පෙර, යේසුස්වහන්සේ සදාකාලයෙන් සදාකාලයට ස්වර්ගයෙහි ජීවත්වූ සේක.

දෙවැනි දෘෂ්ඨිය, යෙහෝවාගේ සාක්ෂිකාරයෝ සහ එවන් ගුරුකුල කිහිපයක් විසින් උගන්වනු ලැබේ. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ නොවන බවත්, ඈත අතීතයේදී දෙවියන්වහන්සේ විසින් මවනුලැබූ බලවත් දේවදූතයෙකු බවත් ඔවුහු ප්‍රකාශ කරති, උන්වහන්සේ පෘතුවිය මත ජීවත්වන්නට පෙර බොහෝ කලක් ස්වර්ගයෙහි ජීවත්වූ බැව් ඔවුහුද විශ්වාස කරති.

මෙම දෘෂ්ඨි දෙකින් එකක් පිළිගන්නා අය නිසැකවම, යේසුස් වහන්සේ ස්වර්ගයෙන් බැස ආ බැව් පවසන පද වචනයේ පරිසමාප්තයෙන්ම පිළිගිනිති.

තුන්වැනි දෘෂඨිය, ක්‍රිස්ටඩෙල්ෆියන්වරු සහ අනෙක් සමහරු දරා සිටිති. මෙම දෘෂ්ඨියට අනුව, උන්වහන්සේ පෘතුවිය මතුපිට උපදින්නට පෙර පෞද්ගලිකව ස්වර්ගයෙහි ජීවත්ව සිටියේ නැත. උන්වහන්සේගේ ස්වර්ගීය සම්භවය පිළිබඳ පද රූපිකව වටහාගත යුතුය.

මෙම පොත්පිංචෙහි විස්තර කෙරෙන්නේ මෙම දෘෂ්ඨියයි. මෙම සිතුවිල්ල ඔබ විශ්මපත් කරන්නේ නම්, කරුණාකර ඉවසීමෙන් යුතුව කියවාගෙන යන්න. මෙම දෘශ්ඨිය සඳහා ආධාර කිරීමට සාක්ෂි බොහොමයක් බයිබලයේ ඇත.

## යේසුස්වහන්සේ සැබෑ මිනිසෙකු වූසේක.

යේසුස්වහන්සේ සාමාන්‍ය පවුකාර මිනිසෙකු නොවූසේක. ඒ ගැන අපි දෝෂසහගත නොවෙමු. උන්වහන්සේ අද්විතීය මනුෂ්‍යයෙකු වූසේක. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා වූසේක. එසේ වුවත්, සැබෑ අරුතකින්, උන්වහන්සේ මනුෂ්‍යයෙකු මිස සර්වබලධාරී දෙවියන්වහන්සේ නොවූසේක.

මෙයින් අදහස් කරන්නේ උන්වහන්සේ ශරීරාකාරයෙන් ස්වර්ගයට ගිය

වහාම මනුෂ්‍යයෙකුව සිටීම අවසන්වූ බැව්, නොවේ. දැන් පවා උන්වහන්සේ පිළිබඳ මනුෂ්‍යයෙකු ලෙස සිතන්නට බයිබලය අපට උගන්වයි. යේසුස්වහන්සේ මළවුන්ගෙන් උත්තානයවී ස්වර්ගයට නැගී බොහෝ කලකට පසු, මෙවන් ප්‍රකාශ නවගිවිසුම කරමින් සිටියේය:

- "....දෙවියන්වහන්සේගේ කරුණාවත්, <u>එකම මනුෂ්‍යයාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ</u> කරුණාවෙන් වූ දීමනාවත් බොහෝ දෙනා සඳහා වැඩිවූයේය... <u>එක මනුෂ්‍යයාගේ</u> කීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා ධර්මිෂ්ඨකරනු ලබන්නෝය" (රෝම 5:15-19

"ඇත්තේ එක දෙවිකෙනෙක් සහ දෙවියන්වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදිහත්කාර කෙනෙකුත්ය.... <u>මනුෂ්‍යයාවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේය"</u> (1 තිමෝති 2:5).

එසේ, යේසුස්වහන්සේ සැබවින්ම මනුෂ්‍යයෙකි. නව ගිවිසුමෙහි සැකරහිත උගැන්වීම මෙයයි. දැන් වුල්විචිහි හිටපු බිෂොප්වූ දොස්තර රොබින්සන්ගේ වදන් සමග සසඳන්න. "දෙවියන්වහන්සේට අවංකව" නමැති ඔහුගේ පොතේ, බොහෝ ක්‍රිස්තියානින් යේසුස්වහන්සේ දකිනා සැටි එක් කොටසක විස්තර කරයි:

> "යේසුස්වහන්සේ සාමාන්‍ය උපතලද මිනිසෙකු නොවීය. උන්වහන්සේ ක්‍රීඩාවක කොටසක් කරමින් සීමිත කාලපරාසයකට දෙවියන් විය. ඔහු මිනිසෙකු ලෙස පෙනුනද, වස්ත්‍ර අභ්‍යන්තරයේ ඔහු දෙවියන්විය- නත්තල් සීයා මෙනි."

බිෂොප්වරයාගේ නත්තල් සීයා සඳහන බොහෝ සභා නායකයන් සඳහා අප්‍රසන්නය. නමුත් එයට අමතරව, මෙය සභා ඉගැන්වීමේ සාධාරණ ප්‍රකාශයක් ලෙසට ඔවුහු එකගවෙත්. යේසුස්වහන්සේ සැබවින්ම දෙවියන්වහන්සේ වූවා නම්, එසේත් නැතිව කලක් ස්වර්ගයෙහි ජීවත්වූ බලවත් දේවදූතයෙකු වූයේ නම්, උන්වහන්සේ කිසිදිනෙක මනුෂ්‍යයෙකු නොවීය. නමුත් මනුෂ්‍ය මාංශය පැළඳි

දිව්‍යමය පුද්ගලයෙක් විය.

නමුත් නව ගිවිසුම එයට එකග නොවේ. යේසුස්වහන්සේ මනුෂ්‍යයෙකු ලෙස විස්තර කරයි. යේසුස්වහන්සේ පිළිබඳ සුලබ දෘෂ්ටිය දේශසහිත බැව් අප සිතන පළමුහේතුව මෙයයි.

## යේසුස්වහන්සේගේ උපත

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත බලවත් ප්‍රාතිහාර්යයක ප්‍රතිපලයකි. උන්වහන්සේගේ මව විශිෂ්ට චරිතයකින් හෙබි අවිවාහක තරුණියක් වූවාය. ඇය කන්‍යාවක් වූවාය. එය සිදුවූයේ මෙසේය:

> "දේවදූතයා ඈට කථාකොට: මරියා, බය නොවන්න. මක්නිසාද නුඹට දෙවියන්වහන්සේගේ කරුණාව ලැබුනේය. බලව නුඹ ගර්භණීව පුත්‍රයෙකු වදන්නිය. උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න.... එවිට මරියා දේවදූතයා හට කථාකොට, මා පුරුෂයෙකු නැඳින සිටින බැවින්, මේක වන්නේ කෙසේද?යි කිවාය. දේවදූතයා ඈට උත්තර දෙමින්, ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ ආනුභවයද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්නට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයැයි කියනු ලබනසේක" (ලූක් 1:30-35).

මෙම වචන අවධානයෙන් අධ්‍යයනය කරන්න. ඒවායින් බොහෝ දේ ඉගෙනීමට ඇත. දරුවා මරියාගේම පුත්‍රයාවන්නට යුතුවිය. "මරියා, දිව්‍යමය තැනැත්තෙකු හට පැමිණ පිවත්වීම සඳහා ඔබ මාංශික ශරීරයක් බිහිකරන්නේ" යැයි දේවදූතයා කීවේ නැත. ඔහු පැවසුවේ, "නුඹ ගර්භනීව පුත්‍රයෙකු වදන්නිය," යනුවෙනි. ප්‍රත්‍යක්ෂවම මෙම වදන් වටහගත යුතුයැයි අදහස් කලේ වචනයේ පරිසමාප්තයෙනි. එය විස්තර කරන්නේ නව මනුෂ්‍ය ජීවිතයක ආරම්භයයි- දිව්‍යමය තැනැත්තෙකු ප්‍රාතුර්භූතයට පැමිණීම නොවේ.

එසේම, යේසුස්වහන්සේ මරියාට වඩා වසර මිලියන ගණනක් වැඩිමහල් දිව්‍යමය පුද්ගලයෙකු වූයේ නම්, සැබෑ අරුතින් උන්වහන්සේ ඇයගේ පුත්‍රයාවීද? නමුත් උන්වහන්සේ ඇයගේ පුත්‍රයාවීය. අසාමාන්‍ය විධියේ

හදාගත් දරුවෙක් නොවීය. සුභාරංචිය පුරාම ඇය උන්වහන්සේගේ මව මීස, කුඩම්මා ලෙස නොහඟවයි.

අනෙක් අතට, යේසුස්වහන්සේගේ මව පසුව විවාහකරගත් යෝසෙප් නමැති මනුෂ්‍යයා, උන්වහන්සේගේ පියා ලෙස සමහර අවස්ථාවන් වලදී හැඳින්වූවත්, සැබෑ යථාර්තය පිළිබඳ අප සැකයෙන් තබා නැත. ලූක් යේසුස්වහන්සේ පිළිබඳ මෙසේ සඳහන් කරයි, "උන්වහන්සේ යෝසෙප්ගේ පුත්‍රයා යැයි මනුෂ්‍යයෝ සිතුවෝය" (ලූක් 3:23).

එසේ යේසුස්වහන්සේ සැබවින්ම මරියාගේ පුත්‍රයාවිය. මරියාගේ පුත්‍රයායැයි වෙස්ගත් දිව්‍යමය පුද්ගලයෙකු නොවිය. දරුවන් කරනා පරිදි, උන්වහන්සේ බොහෝ ආකාරයකින් තම මවගේ ගතිගුණ ගත්හ. යේසුස්වහන්සේ සැබෑ මිනිසෙකු කලේ එයයි. මෙම මනුෂ්‍යයා ලෙසම, සැබෑ මිනිසුන් තම උපතට පෙර ස්වර්ගයෙහි ජීවත් නොවෙත්. පුද්ගලයෙකු වශයෙන් උන්වහන්සේගේ පැවැත්මේ ආරම්භය මෙම ප්‍රාතිහාර්යාත්මක පිළිසිඳගැනීම සහ උත්පත්තිය විය.

මනුෂ්‍යය ස්වභාවය දුර්වල අතර පෙළඹවීම්වලින් ගහනය. අප පසුව බලන පරිදි, මනුෂ්‍යස්වභාවයේ මෙම දුර්වලතාවය උන්වහන්සේ තම මවගෙන් උරුමකරගත්සේක.

නමුත් එය කථාවෙන් අඩක් පමණි. මරියාගේ පුත්‍රයා දෙවියන්වහන්සේගේද පුත්‍රයාවන බැව් දේවදූතයා සරලව ප්‍රකාශ කලේය. "මහෝත්තමයාණන්ගේ ආනුභාවය නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්නට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයැයි කියනු ලබනසේක" ලෙස දේවදූතයා ප්‍රකාශකලේය (ලූක් 1:35).

උන්වහන්සේගේ පියපක්ෂයෙන්ද බොහෝ දේ යේසුස්වහන්සේ උරුමකරගත්සේක. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පියාණන්වූ අතර සැමකල්හිම යහපත්දේ කිරීමේ ආශාව උන්වහන්සේ දෙවියන්වහන්සේගෙන් උරුමකරගත් සේක. තම මිනිස් ස්වභාවයේ දුර්වලතාවය පරාජය කිරීම සඳහා උන්වහන්සේට උපකාර කලේ

මෙයයි- එනම් පෙළඹවීමට විරුද්ධව සටන්කොට එය යටත්කිරීමයි.

## යේසුස්වහන්සේගේ ළමාකාලය

යේසුස්වහන්සේගේ ළමාකාලය පිළිබඳ අපට පවසා ඇත්තේ අල්පයකි. අපට පවසා ඇති එක් දෙයක් අතිශයින්ම වැදගත්ය. උන්වහන්සේ වැඩුනු සැටි මෙලෙස පවසයි:

> "යේසුස්වහන්සේ ප්‍රඥාවෙන් හා උසමහතින්ද දෙවියන්වහන්සේගේත් මනුෂ්‍යයන්ගේත් කරුණාවෙහිද වැඩුනුසේක" (ලූක් 2:52).

යේසුස්වහන්සේ සැබවින්ම දෙවියන්වහන්සේ ලෙස අදහන අය මෙම පදය විසින් ව්‍යාකූල කරවනු ලබයි. දෙවියන්වහන්සේ තමන් සමගම ප්‍රඥාවෙන් සහ කරුණාවෙන් වැඩෙන්නේ කෙසේද? එම අදහසම හාස්‍යජනකය. ප්‍රත්‍යක්ෂවම යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ බවත්, කාලයකට කොලුවෙකුගේ ශරීරය තුළ වැඩසිටින බවත් ලූක් පිළිගත්තේ නැත.

වැඩෙන කොලුවෙකුගේ ශරීරයෙහි වාසයකරමින් යේසුස්වහන්සේ ස්වර්ගයෙන් පැමිණි බලවත් දේවදූතයෙකු නම් අදහස ගැන කුමක්ද? මෙය කලින් අදහසට නොදෙවෙනිය. එවන් දේවදූතයෙකු තමා පෘතුවියට පැමිණෙන්නට බොහෝ කලකට පෙර සර්ව සම්පූර්ණව සිටිය යුතුය. කොලුවෙකුගේ ශරීරය තුළ සිටි දේවදූතවෙකු "ප්‍රඥාවෙන්... සහ දෙවියන්වහන්සේගේ කරුණාවෙහි" වැඩීමට නොහැක.

මෙම පදය විස්තර කරන්නේ සැබෑ තරුණයෙකුගේ වැඩීමයි. ඔහුගේ ශරීරය වැඩිනි. ඔහුගේ නැනවත්භාවය ක්‍රමිකව විශාලවිය. ඔහුගේ චරිතය කෙතරම් යහපත්ව පරිණතවූවාද යත් ඔහුගේ පියාණන් ඔහු කෙරෙහි වඩවඩා ප්‍රසන්නවූසේක.

## පොළඹවීමට එරෙහි ජයග්‍රහණය

මුදලට සටන්වදිනා බොක්සිං හෝ මල්ලවපොර කරුවෝ සමහර අවස්ථාවන්හිදී සටනට පෙර එකට එකතුවී ගණුදෙනුවක් කරන බැව් කියැවේ. එකිනෙකාහට නොරිදවීමට එකගවන ඔවුහු, සමූහයා සඳහා

තමුන් දැඩිව සටන්කරන බැව් පෙන්වති. මෙම ව්‍යාජ සටන කවුරුන් දිනත්දැයි පවා ඔවුන් තීරණය කරන අතර නිසැකවම ත්‍යාගමුදල බෙදාගැනීමටත් එකග වේ.

මෙවන් රැවටිල්ලකට නමක් තිබේ. එය ඇස්බැන්දුම නමින් හැඳින්වේ.

බයිබලය තුළ ස්වාමීවූ යේසුස්වහන්සේ මිනිස් පොළඹවීමට එරෙහි අතිශය ප්‍රබල සටනක් කරනවාසේ විස්තර කර ඇත. උන්වහන්සේ සෑම දිනකම පොළඹවීම සමග සටන්කල අතර, සෑම අවස්ථවකදීම උන්වහන්සේ ජයග්‍රහණය කලසේක.

පොළඹවීම යනු කුමක්දැයි අපි සියල්ලෝම දනිමු. යේසුස්වහන්සේ සැබෑ මිනිසෙකුවූවා නම්, උන්වහන්සේ මුහුණදුන් අරගලය අපට වටහාගත හැකිය. නමුත් යේසුස්වහනසේ මිනිස් ශරීරයක් වැස්ම කරගත් ස්වර්ගිය ජීවියෙකු වුවා නම්, එය කිසිවිටෙක සටනක් නොවිය- එය ඇස්බැන්දුමක් විය.

මක්නිසාද දෙවිනවහන්සේ හෝ දේවදූතයෙකු හෝ අප මෙන් පරීක්‍ෂාවට ලක්කිරීමට නොහැකිය. "දෙවියන්වහන්සේ නපුරෙන් පරීක්‍ෂාකරනු ලබන්නට නුපුළුවන" (යාකොබ් 1:14) යැයි බයිබලය පවසයි.

නමුත් යේසුස්වහන්සේ පිළිබඳව අපට මෙසේ පවසා ඇත:

> "අපට සිටින්නේ... පවුකිරීමක් නැතිව සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්‍ෂාකරනු ලැබූ උත්තම පූජකයෙක්ය" (හෙබ්‍රෙව් 4:15).

එක්තරා අවස්ථාවක යේසුස්වහන්සේ පරීක්‍ෂාවට එරෙහිව සටන් කරන විට, "මාගේ කැමැත්ත නොව, ඔබගේ කැමැත්ත වේවා" (ලූක් 22:42) යැයි කීසේක.

දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට ඉඩදීම වශයෙන්, තමන්ගේම කැමැත්ත පොඩිකිරීමට යේසුස්වහන්සේහට සිදුවිය.

උන්වහන්සේ සැබවින්ම මනුෂ්‍යයෙකුවූවා නම්, මෙම පදය අපට වටහාගැනීමට පුලුවන. නමුත් යේසුස්වහන්සේ සැබවින්ම දෙවියන්වහන්සේ හෝ මිනිස් වෙස්ගත් දේවදූතයෙකු හෝ වූවා නම්, එහි අර්ථයක් නොමැත.

## යේසුස්වහන්සේ පරිපූර්ණවූයේ කෙසේද?

යමක් පූර්ණත්වයෙන් අඩුවීම සඳහා බොහෝ වෙනස් ක්‍රම දෙකක් ඇත. මේවා අතර වෙනස අගයකිරීම වැදගත්ය.

කඩාවැටෙන්නට ආසන්න පැරණි ගෙයක් පරිපූර්ණ නොවේ. එය දිරාගොස් ඇති නිසාවෙනි: එහි බොහෝ දෝෂ තිබේ.

අඩක් ගොඩනැගූ නව නිවසක්ද පරිපූර්ණ නොවේ. නමුත් මෙය වෙනස් විධියේ අසම්පූර්ණතාවයකි. අඩක් නිමකල මෙම නිවසේ දෝශයක් නොමැත. එය සතුටුදායකය. නමුත් එය තවම සම්පූර්ණ නැත.

මෙහි පළමු අරුතින් යේසුස්වහන්සේ කිසිවිටෙක අසම්පූර්ණව නොසිටිසේක. උන්වහන්සේ තුළ කිසි වැරැද්දක් නොතිබිනි. උන්වහන්සේ එක්වරක් හෝ පවු නොකලහ.

එසේ වුවත්, සදම්පූර්ණවන තෙක් නිවසක් ගොඩනැගිය යුතුසේ, උන්වහන්සේගේ චරිතය ක්‍රමිකව ගොඩනගන්නට තිබුනි. මෙම අරුතින් මෙම බයිබල් පද පෙන්වන පරිදි උන්වහන්සේ පරිපූර්ණ වියයුතුව තිබුනි:

> "උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නමුත් තමන් වින්ද දේවලින් කීකරුකම ඉගෙනගත්සේක. මෙසේ උන්වහන්සේ සම්පූර්ණකරනු ලැබ... සදාකාල ගැළවීමේ කර්තෘ වුසේක" (හෙබ්‍රෙව් 5:8,9).

> "කුමක්හෙයින්ද යමෙකු නිසාත් යමෙකු කරණකොටගෙනත් සියල්ල පවත්නේද, ඒ තැනන්වහන්සේ විසින් බොහෝ පුත්‍රයන් තේජසට ගෙනයන කල ඔවුන්ගේ ගැළවීමේ කර්තෘවහන්සේ දුක්විදීම කරණකොටගෙන සම්පර්ණ කරන්නට යුතුවූයේය" (හෙබ්‍රෙයව් 2:10).

යේසුස්වහනසේ මිනිස් ශරීරයක වස්ත්‍ර දරා සිටි දව්‍යමය ජීවියෙකු නමැති ජනප්‍රිය ආකල්පය තුළ යම්කිසි දෝශයක් ඇති බැව් නැවතත් පැහැදිළිය. එවැනි ජීවියෙකු "තමන් වින්ද දේවලින් කීකරුකම ඉගෙන

ගත්තේයැයි" ඔබට සිතිය හැකිද? එවන් පරිපූර්ණ දිව්‍යමය ජීවියෙක් "දුක්විඳීම කරණකොටගෙන සම්පූර්ණ වුවා යැයි" ඔබට සිතිය හැකිද?

සත්තකින්ම නැත. මෙතැන අපට ඇත්තේ, තලයෙන් තලය පරිපූර්ණ චරිතයක් ගොඩනංවන සැබෑ මනුෂ්‍යයෙකුගේ විස්තරයකි.

යේසුස්වහනසේ දෙවියන්වහන්සේවුවා නම්, එසේත් නැතිනම් බලවත් දේවදූතයෙකු වුවා නම්, උන්වහන්සේ ලෝකයට පැමිණීමට බොහෝ කලකට පෙර සම්පූර්ණවී තිදිය යුතුය. නමුත් එය එසේ නොවිය. පෘතුවිය මත වේදනා විඳීම තුළින් යේසුස්වහන්සේ සම්පූර්ණවූ බැව් පවසා ඇත.

## <u>කුරුසිය මත උන්වහන්සේගේ මරණය</u>

උන්වහන්සේගේ ස්වභාවය පිළිබඳ වඩා සුලබ දෘෂ්ඨී දරා සිටින අය සඳහා, ස්වාමිවූ යේසුස්වහන්සේගේ මරණය තවත් ගැටලුවක් ඉදිරිපත් කරයි. දෙවියන්වහන්සේ මිය යෑමට නොහැකි බැව් බයිබලය පවසයි (දානියෙල් 12:7, 1 තිමෝති 6:16). දේවදූතයන්ද එසේමය (මතෙව් 22:30).

නමුත්, සියල්ලෝම දන්නා පරිදි, යේසුස්වහන්සේ කුරුසිය මත මියගියසේක.

සමහර අය ඔවුන් සතුව මේ සඳහා පිළිතුරක් ඇතැයි සිතත්. "එසේය මියගියේ සිරුර පමණකි ශරීරය තුළ සිටි ආත්මික ජීවියා ජීවත්විය" ලෙස ඔවුහු පවසති.

මෙය වැරදිය. යේසුස්වහන්සේගේ මියගියේ සිරුර පමණක් නොවේ යැයි බයිබලය ප්‍රකාශකරයි. උන්වහන්සේ "තමන් ප්‍රාණය මරණයට වගුරුවා දුන්" බැව් අපහට පවසයි (යෙසායා 53:12).

වැඩිදුරටත්, අප මෙන්ම යේසුස්වහන්සේද මරණයට බියවූ බැව් බයිබලය අපට පෙන්වයි. අපහට මෙන්ම උන්වහනසේ හටද, මරණය බියකරු අත්දැකීමක් විය.

"උන්වහන්සේ මාංසවත්ව සිටි දවස්වලදී තමන්වහන්සේ

මරණයෙන් ගළවන්නට පුලුවන්වූ තැනැන්වහන්සේට බලවත් හැඬීමෙන් සහ කඳුලින් යුක්ත යාච්ඤා සහ කන්නලව් ඔප්පුකර, තමන්ගේ දේවභය නිසා උත්තර ලැබ..." (හෙබ්‍රෙව් 5:7).

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේවත්, මිනිස් ස්වරූපයෙන් යුත් දේවදූතයෙක්වත් නොවූ බවට මෙය ශක්තිමත් සාක්ෂිය. එවන් ජීවියෙකු තම තාවකාලික මිනිස් ශරීරය නැතිකර ගැනීමේ සිතුවිල්ල සඳහා එතරම් දැඩි වේදනාවක් විදිද?

සත්තකින්ම, මරණය කෙරෙහි එසේ හැගෙන්නේ, සැබවින්ම මියයාමට ආසන්න, සැබෑ මිනිසෙකුට පමණි.

## යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු පාර්ශවයෙහි සිටින්නේ ඇයි?

වර්තමාන අවස්ථාවේදී, යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි හිඳගෙන සිටි (ගීතාවලිය 110:1, හෙබ්‍රෙව් 1:13). මෙම වදන තුළින් සහ අනෙකුත් බොහෝ ක්‍රම තුළින් යේසුස්වහන්සේ කෙතරම් ශ්‍රෙෂ්ඨදැයි බයිබලය අපට පවසයි. දෙවියන්වහන්සේට පමණක් දෙවැනිව, මුළු මැවිල්ලෙහි දෙවැනි ශ්‍රෙෂ්ඨතම පුද්ගලයා උන්වහන්සේය.

දැන්, අප මෙම ප්‍රශ්න ඇසුවහොත්, "මෙසේ වන්නේ ඇයි?" යේසුස්වහන්සේ මෙතරම් ශ්‍රෙෂ්ඨ ඇයි?" දෙවියන්වහන්සේ උන්වහන්සේ සඳහා එතරම් උසස් ස්ථානයක්දී ඇත්තේ ඇයි?"

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ හෝ දේවදූතයෙකු හෝ ලෙස විශ්වාස කරණ අය සතුව සරල පිළිතුරක් ඇත. "උන්වහන්සේ සැමකල්හිම ශ්‍රේෂ්ඨව සිටි නිසාය. පෘතුවියට පැමිණීමට පෙර උන්වහන්සේ ස්වර්ගයෙහි ශ්‍රෙෂ්ඨ ආත්මයක් වූසේක. පසුව, උන්වහන්සේ තමනට හිමි ස්ථානය කරා නැවත ගියසේක. උන්වහන්සේ පැමිණි උසස් ස්ථානයටම උන්වහන්සේ නැවත ගියසේක" ලෙස ඔවුන් පවසනු ඇත.

නමුත් බයිබලයේ පිළිතුර මෙය නොවේ.

පෘතුවිය මත උන්වහන්සේගේ ජීවිතයෙන් පසු යේසුස්වන්සේ ශ්‍රෙෂ්ඨවූ

බැව් බයිබලය පවසයි. දෙවියන්වහන්සේ උන්වහන්සේ ශ්‍රේෂ්ඨකල නිසා, එවිට උන්වහන්සේ ශ්‍රේෂ්ඨවූ බැව් එය පවසයි. උන්වහන්සේ පෘතුවිය මත කල දේ මගින්, උන්වහන්සේහට එය සුදුසු නිසා දෙවියන්වහනසේ උන්වහන්සේ ශ්‍රේෂ්ඨකල බැව් එය අපට පුනපුනා පවසයි.

"යේසුස්වහන්සේ මරණය වින්ද නිසා තේජස හා ගෞරවය නමැති ඔටුන්න පැළඳගෙන සිටින බව අපට පෙනේ" (හෙබ්‍රෙව් 2:9).

"ඔහු (යේසුස්වහන්සේ) මා (දෙවියන්වහන්සේ) කෙරෙහි ඇලුම්වූ බැවින් ඔහු මුදාහරින්නෙමි. මාගේ නාමය දැන සිටින බැවින් ඔහු උසස්කරන්නෙමි" (ගීතාවලිය 91:41).

"ඔබ (යේසුස්වහන්සේ) ධර්මිෂ්ඨකමට ප්‍රියව, දුෂ්ට කමට ද්වේෂකලසේක. එබැවින් දෙවියන්වහන්සේ, ඔබගේ දෙවියන්වහනසේ, ඔබගේ පංගුකාරයන්ට වඩා ඔබ සන්තෝෂය නමැති තෛලයෙන් ආලේපකලසේක" (ගීතාවලිය 45:7).

"මරණය, එසේය, කුරුසියේ මරණය දක්වා කීකරුවූසේක. එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේට ඉතා උසස්කොට..." (පිලිප් 2:8,9).

යේසුස්වහන්සේ සැබෑ මිනිසෙකුවූ බවට සහතිකවම අවසාන සහ තීරණාත්මක සාක්ෂිය මෙයයි. සැබෑ මනුෂ්‍යයෙකු, නමුත් ඉතා විශේෂවූ මනුෂ්‍යයෙකුය. මිනිස් පොළඹවීම සම්පූර්ණයෙන්ම යටත් කරගත් එකම මිනිසා උන්වහන්සේය. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු පාර්ශවයෙහි දැන් වැඩසිටින්නේ ඒ නිසාවෙනි.

## දෙවියන්වහන්සේගේ දෘෂ්ඨිකෝණයෙන් බැලීම

1 සහ 2 පිටුවල යේසුස්වහන්සේගේ මෙම වචන දෙස අපි බැලුවෙමු. "මම ස්වර්ගයෙන් බැස ආවෙමි." "අප අවට ඇති සියලු යහපත් දීමනා ඉහල ස්වර්ගයෙන් එවා ඇත" නමැති ගීතිකාවේ බයිබල් පාදක

වචන සිහිකර ගනිමින්, යේසුස්වහන්සේගේ මෙම වචන ප්‍රායෝගික නොව, ලෙහෙසියෙන්ම රූපිකවන්නට හැකිබැව් අපි දුටුවෙමු.

දැන් අපහට වඩා නිශ්චිත නිගමණයකට එළඹිය හැක. අප බැලූ සියලු සරල උගැන්වීම්වල ආලෝකය තුළින්, යේසුස්වහන්සේ සැබෑ මනුෂ්‍යයෙකුවූ බැව් අපට නිශ්චිතවිය හැක. එය එසේ නම්, උන්වහන්සේගේ වචනවූ "ස්වර්ගයෙන් බැස පැමිණීම" සරලව රූපික වියයුතු විය. දැන් අපට ඒ ගැන සහතික විය හැකිය. ස්වර්ගයෙහි දෙවියන්වහන්සේ පෘතුවිය දෙස පහත්වී, මරියාවූ තම මව ශ්‍රෙෂ්ඨ ප්‍රාතිහාර්යයක් කලවිට තම ජීවිතය ආරම්භවූ බැව් උන්වහන්සේ හගවන්නට ඇත.

ගැටළු සහගත තවත් පද ඇත. උදාහරණයක් ලෙස යොහන් 17:5 පදයේ වචන ඇත. "ලෝකය තිබෙන්නට පළමුවෙන් ඔබ වෙත මට තිබුනු මහිමයෙන්" සහ එවන් ප්‍රකාශ ඇති තවත් පද යේසුස්වහන්සේ ප්‍රකාශකරනසේක. මෙයද රූපික භාෂාව වන්නට හැකිද? එසේ විය හැකිය. නමුත් එවන් ප්‍රකාශවල අරුත අගය කිරීම සඳහා, දෙවියන්වහන්සේගේ දෘෂ්ඨිකෝණයෙන් බැලීමට අප විශේෂ උත්සාහයක් ගත යුතුය.

දෙවියන්වහන්සේ සහ අප අතර බොහෝ වෙනස්කම් තිබේ. මේ අවස්ථාවේදී අප සැලකිලිමත් වනුයේ මෙය ගැනය. අප සඳහා අනාගතය නුහුරුය. අපට හැක්කේ හෙට සිදුවන්නේ කුමක්දැයි අනුමාන කිරීමය. <u>නමුත් දෙවියන්වහන්සේ අනාගතය දන්නාසේක</u>. අපට අද මෙන්, උන්වහන්සේට හෙට යථාර්ථය. බයිබල් පුරෝකථන සැමවිටම සත්‍යවන්නේ එමනිසාය.

රෝම 4:17 දී පාවුල් මේ පිළිබඳව අදහස් පලකලේය. උත්පත්ති පොත තුළ, "මම ඔබ බොහෝ ජාතීන්ගේ පියා කලෙමි"යි දෙවියන්වහන්සේ ආබ්‍රහම්හට ප්‍රකාශකල බැව් ඔහු පෙන්වා දුන්නේය.

"කලෙමි" නමැති වචනය නිරීක්ෂණය කරන්න. "මම කරන්නෙමි" නොව, "මම...කලෙමි"ය. එම අවස්ථාවේදී ආබ්‍රහම් හට සිටියේ එක් දරුවෙක් පමණි. නමුත් දෙවියන්වහන්සේ යමක් පොරොන්දුවූ විට, එම පොරොන්දුව ස්ථිරය. එය සිදුවූසේම ස්ථිරය.

මිනිසෙකු පොරොන්දුවක් වන කල්හි ඔහු සාමාන්‍යයෙන් පවසන්නේ, "මම අසවල් දේ කරන්නට අදිටන් කරමි" යනුවෙනි. නමුත් දෙවියන්වහන්සේ, අනාගතය පිළිබඳව තම දිවැස්වරු තුළින් පවසන්නේ, "මම අසවල් දේ කළෙමි" යනුවෙනි. එය උන්වහන්සේ නිශ්චිතවම එය කරන බැව් හැඟවීමයි.

රෝම 4:17 දෙවැනි කොටසේ, මෙම පාඩම් පාවුල් ගෙනහැර පෑවේය. දෙවියන්වහන්සේ "නැති දේ ඇති දේ මෙන් සඳහන් කරන්නාවූ..." ලෙස පැවසුවේය.

## දෙවියන්වහන්සේහට අනාගතය තථ්‍යය

අපෝස්තුලුවර පාවුල්ගේ සුළු උපකාරයක් සමග, අපි වැදගත් ප්‍රතිපත්තියක් ස්ථාපිතකර ඇත්තෙමු. අප සඳහා තත්‍යවන්නේ අතීතය සහ වර්තමානය පමණි. අනාගතය අපගේ දෑස්වලින් සැඟවිය.

නමුත් දෙවියන්වහන්සේ වෙනස්ය. උන්වහන්සේහට අනාගතතය සර්වසම්පූර්ණ ලෙස බැලිය හැක. වර්තමානය මිනිසුන්ට මෙන්, දෙවියන්වහන්සේහට අනාගතය සැබෑය. ප්‍රතිපලයක් ලෙස, එය සිදුවී අවසානවූ විලසින් අනාගතය පිළිබඳ දෙවියන්වහන්සේ හට කථාකල හැක.

දෙවියන්වහන්සේ මෙසේ කථාකල අවස්ථා බොහොමයක් බයිබලයේ ඇත. ඒවායින් තුනක් මෙන්න.

1. "ස්වාමින්වහන්සේගේ වචනය මා වෙතට පැමිණ කියනුයේ, මම නුඹ ගර්භයෙහි සාදන්නට පළමුවෙන් නුඹ හඳුනාගෙන සිටියෙමි. නුඹ කුසෙන් නික්මෙන්නට පළමුවෙන් මම නුඹ කැපකොට..." (යෙරමියා 1:4,5).

ඔහු උපදින්නට පෙර දෙවියන්වහන්සේ යෙරමියා දැනසිටියහ! ප්‍රත්‍යක්ෂවම, මෙය රූපික භාෂාවයි, එහි අදහස තම උපතට පෙර යෙරමියා සැබවින්ම ජීවත්වූ බැව් නොවේ. එහි අරුත, දෙවියන්වහන්සේ හට අනාගතය තුළට බැලිය හැකිවූ බවත්, උපතට පෙර යෙරමියා දැකගත හැකිවූ බවත්ය. එය තවත් විධියකින්

ප්‍රකාශකරනවා නම්, යෙරමියා උපදින්නට පෙර, ඔහු දෙවියන්වහන්සේගේ මනස තුළ පැවතින.

2. "ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම උන්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල සියලු ආත්මික ආශිර්වාදවලින් අපට ආශිර්වාද කලසේක... තමන්වහන්සේගේ කැමැත්තේ ප්‍රසන්නකමේ හැටියට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පුත්‍රයන්විමට අප පෙර නියමකලසේක" (එපීස 1:4,5).

එවිට යෙරමියා පමණක් නොව, තම සභාවේ සාමාජිකයන් පවා ඔවුන්ගේ උපතට පෙර දෙවියන්වහනසේ දැනසිටිසේක. අනාගතය තුළ දෙවියන්වහන්සේගේ දැනුම පදනම් කරගත් මෙයද රූපික භාෂාවයි. එම උද්ධෘතයේ දෙවැනි වාක්‍යයේ පාවුල් තමා හැගවූදේ ප්‍රායෝගික භාෂාවෙන් පවසයි: අප පෙර නියම කල ලෙසය.

3. "ලෝකය මැවීමට පළමුවෙන් නියම කරනු ලැබූ උන්වහන්සේ (යේසුස්වහන්සේ)... නුඹලා උදෙසා කාලවල කෙලවරදී ප්‍රකාශකරනු ලැබූසේක" (1පේතෘස් 1-20).

එම උද්ධෘතයේ "නියම කරනු ලැබූ" නමැති වචනය වැදගත්ය. එය "කලින් දැනගත්" අරුත හිමි ග්‍රීක වචනයක පරිවර්තනයයි. අපගේ "රෝගනිමිත්ත" නමැති වදන පැමිණ ඇත්තේ මෙම ග්‍රීක වදනේ ප්‍රභේදයකිනි.

රෝගනිමිත්ත වචනය බොහෝ අවස්ථාවන්හිදී වෛද්‍යවරු භාවිතාකරති. එහි ග්‍රීක සමාන පදය ලෙස එහි අරුත "කලින් දැනසිටීමයි." "මෙම මිනිසාට පිලිකාවක් තිබේ. මාගේ රෝගනිමිත්ත නම්, රුධිරය ගැලීම නොනවත්වා කෙටි මසක් ඇතුළත ඔහු මියයන බවයි" යනුවෙන් වෛද්‍යවරයෙකු පවසනු ඇත.

වෛද්‍යවරුනට වැරදි සිදුවිය හැකිය. ඔවුන්ගේ රෝගනිමිති, කාලගුණ අනාවැකි මෙන්, වැරදිවිය හැකිය. දෙවියන්වහන්සේ වෙනස්ය. උන්වහන්සේ සැබවින්ම කලින් දැනසිටිනසේක. දෙවියන්වහන්සේගේ

රෝග නිමිත්ත නිශ්චිතවම ස්ථිරය.

ඉහත සඳහන් පදය එසේනම් අපහට පවසන්නේ, ලෝකය මැවීමට පෙර යේසුස්වහන්සේ පිළිබඳ සියලුදේ දෙවියන්වහන්සේ දැනසිටි බවයි. අප බලාපොරොත්තුවිය යුත්තේද මෙයයි. කලින් සඳහන් කල උද්ධෘතයක, ලෝකයේ ආරම්භයට පෙර සිටම පළමු ක්‍රිස්තියානින් පිළිබඳ දෙවියන්වහන්සේ දැන සිටි බැව් අපි දුටුවෙමු.

යෙරමියා, පළමු සභාව සහ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, කාලයේ ආරම්භයේ සිට දෙවියන්වහන්සේගේ මනසේ වූහ.
එමනිසා, ස්වර්ගයේ සිටින්නාවූ තම පියාණන්හට යේසුස්වහන්සේ මෙසේ පැවසීම පුදුමයක් නොවේ, "ලෝකය තිබෙන්නට පළමුවෙන් ඔබ වෙත මට තිබුනු මහිමයෙන් ඔබ වෙත මා ගෞරවයට පැමිණෙවු මැනව" (යොහන් 17:5).

මෙමගින් උන්වහන්සේ හැගවූ දේ දැන් අපි දනිමු.

## ශ්‍රේෂ්ඨ සැලසුම්කරුවූ දෙවියන්වහන්සේ

මිනිසුන් වැදගත් යමක් කරන්නට යෝජනා කරන විට ඔවුන් එය ආරම්භ කරන්යේ සැලැස්මක් ඇඳීමෙනි. ආක්‍රමණයක් දියත්කිරීමට ප්‍රථම, යුධහමුදා අණදෙන නිලධාරියෙක් සටන් සැලැස්මක් සාදා, එය තම ප්‍රධානීන්ට එළිදරව් කරයි. මහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පෙර, ගෘහනිර්මාණ ශිල්පියෙකු සැලැස්මක් අඳිනු ඇත.

බොහෝ අවස්ථාවන්හිදී මිනිසුන්ගේ සැලැසුම් නිශ්පල වෙයි. සතුරාගේ විශ්මිත පහරදීමකින් හමුදාප්‍රධානීන්හට තම පහරදීම කලනොහැකිය. සේවාදායකයාගේ මුදල් අවසන්වී, තම සැලසුම් ඉරා දමන්නැයි ගෘහනිර්මාණ ශිල්පියාහට පැවසිය හැකිය.
නමුත් ලෝකය සඳහා උන්වහන්සේගේ සැලසුම් ක්‍රියාත්මක කිරීම කිසිවකට නවැත්විය නොහැක. අප දුටු පරිදි, තම කාර්යය ආරම්භ කිරීමට පෙරම එම සැලැස්ම සම්පූර්ණකර ඇති ලෙස උන්වහන්සේ කථාකිරීම ආරම්භකලසේක.

දෙවියන්වහන්සේගේ සැලැස්ම සඳහා නමක් පැරණි ගිවිසුමේ තිබුනි. එය දෙවියන්වහන්සේගේ "ප්‍රඥාව" ලෙස නම් කෙරින. නව බයිබල් ශබ්දකෝෂය (මෙය ලියන ලද්දේ සහානායකයන් විසිනි, ක්‍රිස්ටඩෙල්ෆියන්වරු නොවේ) පැරණි ගිවිසුමේ ප්‍රඥාව නියෝජනය කරන්නේ "තමන්වහන්සේගේ මනස තුළ ඇති දේ දෙවියන්වහන්සේගේ ප්‍රබල සම්පූර්ණ කිරීම" ලෙස පවසයි.

මෙය හොඳ නිර්වචනයකි. පහත දැක්වෙන පැරණි ගිවිසුම් කොටස් සඳහා එය හොඳින් ගැලපේ.

> "ප්‍රඥාතෙමෝ මොර නොගසන්නීද? ඥානයද ඇගේ හඬ නෙනගින්නිද?... පිවිසෙන දොරවලත් ඈ ශබ්දනගා කියන්නී... ස්වාමීන්වහන්සේ තමන් පුරාතන ක්‍රියාවලට පළමුවෙන්... මා (ප්‍රඥාව) පිහිටවූසේක. පොළොව ඇතිවන්නට පළමුවෙන් මුලපටන්... පිහිටුවනු ලැබීම්" (හිතෝපදේශ 8:1-23).

වෙනත් වචනවලින්, දෙවියන්වහන්සේ තම ක්‍රියාව ආරම්භ කිරීමට පෙර සැලැස්මක් සාදන ලදි- යුදෙව්වෝ එය ප්‍රඥාව ලෙස හැඳින්වූහ.

දෙවියන්ගේ දෙවියෙකු පිළිබඳ ඇදහූ ග්‍රීකවරු- ඔහු බයිබලයේ දෙවියන්වහන්සේ නොවේ- එයට තවත් නමක් දුන්හ. ඔවුහු එය "වාක්‍යයාණෝ" ලෙස හැඳින්වූහ. පළමු බයිබල් ශබ්දකෝෂයම, මෙම "වාක්‍යයාණෝ" නමැති ග්‍රීක වචනයේ අදහස "දෙවියන්වහන්සේගේ සැලැස්මත්, මැවීමේ දෙවියන්වහන්සේගේ බලයත්" ලෙස හැඳින්වූහ.

යොහන්ගේ සුභාරංචියේ පළමුවැනි පරිච්ඡේදය වටහා ගැනීමට මෙය උපකාර කරන බැවින්, එය වැදගත්ය. දෙවියන්වහන්සේගේ වාක්‍යයාණෝ නමැති ග්‍රීක අදහසත්, දෙවියන්වහන්සේගේ ප්‍රඥාව නමැති යුදෙව් අදහසත් යොහන් මිශ්‍රකර ඇතුවාසේය. "පටන්ගැන්මේදී වාක්‍යයාණෝ සිටිසේක" ලෙස ඔහුගේ සුභාරංචිය ආරම්භකෙරේ.

මෙම කොටසෙහි කිසි අර්ථයක් සමහර අයහට ගත නොහැක. තවත් සමහරු එය ඔවුනට හැකිබැව් සිතුවත්, ඔවුහු එහි වැරදි අර්ථය ගනිති මක්නිසාද වාක්‍යයාණෝ සජීවී ජීවියෙකු බැව් ඔවුන් සිතන හෙයිනි. (මෙම

කොටසෙහි පරිවර්තකයන්, වාක්‍යයාණෝ සඳහා "ඔහු" - උන්වහන්සේ - යැයි යොදන්නේ එබැවිනි. "ඔහු" යන්න ග්‍රීක භාෂාවෙන් "එය" ද වියහැකි අතර, එය පරිවර්තනය කලයුතුව තිබුනේ එසේය).

අප දැන් උන්වහන්සේගේ "වාක්‍යයාණෝ" වෙනුවට දෙවියන්වහන්සේගේ "සැලැස්ම" ලෙස සිතා, "උන්වහන්සේ" වෙනුවට "එය" යෙදුවහොත්, යොහන් 1 තුළින් අප ඉගෙනගන්නේ මෙයයි:

> "එටන්ගැන්මෙහිදී සැලැස්ම තිබුනේය. සැලැස්ම දෙවියන්වහන්සේ සමග තිබුනි. සැලැස්ම දෙවියන්වහන්සේ විය. එය පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ සමග විය. එය කරණකොටගෙන සියල්ල සාදන ලද්දේය. සාදනලද කිසිවක් එය නොමැතිව සාදන නොලද්දේය. එය තුළ ජීවනය තිබුනේය. ඒ ජීවනය මනුෂ්‍යයන්ගේ ආලෝකය වුයේය... සැලැස්ම මාංශවත්ව කරුණාවෙන්ද සත්‍යයෙන්ද පූර්ණව අප අතරෙහි වාසය කලේය. පියාණන්වහන්සේ වෙතින්වූ ඒකජාතක පුත්‍රයාණන්වහන්සේගේ මහිමය වැනි උන්වහන්සේගේ මහිමය දුටිමුව" (යොහන් 1:1-14).

යොහන්ගේ මෙම වදන් බයිබල උගැන්වීම මනහරව සංක්ෂිප්තගතකරයි. යේසුස්වහන්සේ ආරම්භයේ සිටම ස්වර්ගයේ වැඩසිටිසේක- නමුත් පුද්ගලයෙකු ලෙස නොවේ. දෙවියන්වහන්සේගේ සැලැස්මේ කේන්ද්‍රය ලෙස, දෙවියන්වහන්සේගේ මනස තුළවූ ශ්‍රේෂ්ඨ අදහසක් ලෙස උන්වහන්සේ වැඩසිටිසේක. බෙත්ලෙහෙම්හි උපත ලබන තෙක්, උන්වහන්සේහට පුද්ගලයෙකු ලෙස පැවැත්මක් නොවිය. එවිට යොහන්ගේ පදයේ "සැලැස්ම මාංසගතවිය."

## යේසුස්වහන්සේහට ගෞරවකිරීම

යේසුස්වහන්සේ පිළිබඳව බයිබලය සැබැවින්ම උගන්වන්නේ කුමක්දැයි දැන් දුටු අප, පෙර නොකල තරමේ ගෞරවයකින් උන්වහන්සේහට ගෞරවකිරීම ආරම්භකල හැක. අප සාකච්ජා කල දේ ගැන නැවත ඔබ සිතා බලනවා නම්, එසේ විය යුත්තේ මන්ද යන්න ඔබට පෙනෙනවා ඇත.

බයිබලය තුළ භාෂා දෙවර්ගයක් ඇති බැව් අපි දුටිමු. මතුපිටින් පවසන දේ නිශ්චිතවම හඟවන ප්‍රායෝගික භාෂාව ඇත. ගැඹුරු අර්ථයක් රඳවන රූපික භාෂාව ඇත.

තමන් ස්වර්ගයෙන් බැස ආ බැව් පැවසූ යේසුස්වහන්සේ, පෞද්ගලිකව කිසි දිනෙක ස්වර්ගයෙහි නොසිටිසේක. එමනිසා, උන්වහන්සේගේ වචන ප්‍රායෝගිකව සත්‍ය නොවිය හැකිවූ නමුත් රූපික අරුතක් තිබිය යුතුය.

දෙවියන්වහන්සේ සියලු දේ දන්නා නිසා උන්වහන්සේට අනාගතය තුළට බැලියහැක. සර්වබලධාරී දෙවියන්වහන්සේ යමක් කළ යුතුයැයි තීරණය කලවිට, එය ඉටුවූවා හා සමානය. එමනිසා, දෙවියන්වහන්සේ ලෝකය මැවීමට ප්‍රථම සැලැස්මක් සැදූසේක. මෙම සැලැස්මේ ආරම්භයත්, එහි වඩාත්ම වැදගත් කොටසත්වූයේ යේසුස්වහන්සේය. යේසුස්වහන්සේගේ අනුගාමිකයන් සියල්ලද සැලැස්මේ වූවෝය. ඔවුන් සහ යේසුස්වහන්සේ පිළිබඳව, ලෝකය මැවීමට පෙර පැවතිසේ කථාකර ඇත.

සැබවින්ම උන්වහන්සේ හෝ ඔවුහු එවිට ජීවත්වී නොසිටියහ. උන්වහන්සේගේ සැලැස්මේ කොටසක් ලෙස ඔවුන් දෙවියන්වහන්සේගේ මනසෙහි පමණක් පැවතුනි. මෙම රූපික අරුතින්, මැවීමේ ආරම්භයේ සිටම ඔවුහු ස්වර්ගයෙහි වූහ.

නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නිත්‍ය ජීවිතය ආරම්භවූයේ උන්වහන්සේ බෙත්ලෙහෙමේදී උපත ලදවිට පමණි. උන්වහන්සේගේ උපත ප්‍රාතිහාර්යයක අනුසරණයක් විය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පියාණන්වූ අතර මවවූ මරියා කන්‍යාවක් වූවාය.

ඇය උන්වහන්සේගේ නිත්‍ය මව වූවාය. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා වූවාසේම ඇයගේද පුත්‍රයා වූසේක. මෙම කරුණ නිසා උන්වහන්සේ නත්‍ය මිනිසෙකු වූසේක. මෙහි අරුත වූයේ, අනෙක් ඕනෑම මිනිසෙකු මෙන් උන්වහන්සේද පාපයට පොළඹවීම් වින්ද බවයි.

නමුත් උන්වහන්සේ සම්පූර්ණව පොළඹවීම යටත්කරගත්සේක. උන්වහන්සේ පාපරහිත දිවියක් ගෙවා පරිපූර්ණ චරිතයක්

ගොඩනැගුසේක. මෙය සඳහා දීමනාවක් ලෙස, දෙවියන්වහන්සේ උන්වහන්සේ මළවුනගෙන් නැගිටුවා දෙවියන්වහන්සේට පසු විශ්වයේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා කලසේක.

මම ක්‍රමයෙන් දෙවියන්වහන්සේ යේසුස්වහන්සේහට ගෞරවකලේ නම්, එම හේතුව උදෙසාම අපිද උන්වහන්සේහට ගෞරව කලයුතු වෙමු. අපහටද ඉහල ස්වර්ගය දෙස බලා දෙවියන්වහන්සේහට මෙසේ පැවසීමට හැකිවිය යුතුය:

"අපගේ ස්වර්ගීය පියාණෙනි, මා හට සටන් කිරීමට ඇතිවාක් මෙන්ම ඔබවහන්සේගේ පුත්‍රයාහටද පෙළඹවීමට එරෙහිව සටන්කිරීමට සිදුවිය. එමනිසා මට දැනෙන දෙය උන්වහන්සේ දන්නවා ඇත.

"නමුත් පොළඹවීමට විරුද්ධව උන්වහන්සේ සියලු සටන් ජයගත් නමුත් මම නිරන්තරයෙන්ම පරාජයවෙමි. ස්වාමීන්වහන්ස, උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය මා අගයන අතර මා කරනවාට වඩා උන්වහන්සේගේ ආදර්ශය අනුගමණය කිරීමට කැමතිවෙමි.

"නමුත් මම දුර්වල වෙමි. ස්වාමීන්වහන්ස, මා හට අනුකම්පාකර මට උපකාර වුව මැනව. ඔබවහන්සේගේ පුත්‍රයාසේ වීමට මට වඩාත් උපකාර කරනු මැනව. උන්වහන්සේ අනුගමනය කිරීම සඳහා මුලු හදවතින් උත්සාහ ගැනීමට මට උදව්වුව මැනව. උන්වහන්සේහට ප්‍රේමකිරීමට, ගෞරවකිරීමට සහ කීකරුවීමට මට උදව්වුව මැනව.

"සර්වබලධාරී දෙවියන්වහන්ස, ඔබවහන්සේගේ පුත්‍රයා විඳවීම සහ මරණය පිරී මෙම ජීවිතය අත්දුටුවෙහිය. උන්වහන්සේහට වැටහෙන බැව් මා දන්නා නිසා, ස්වාමීන්වහන්ස, උන්වහන්සේ තුළින් ඔබවහන්සේහට උපකාර උදෙසා යාච්ඤා කරමි. ඔබවහන්සේ මා ශ්‍රවණය කරන බැව් මම දනිමි".

මෙම ප්‍රකාශනයේ ශුද්ධලියවිලි උපුටාගැනීම්, ශුද්ධබයිබලයේ SINHALA UNION (OLD) VERSION ගෙනි..